


# පවිත්‍ර ගංගා

## ගංගා ද්‍රෝණි කළමනාකරණය පිළිබඳ නව සංකල්පයක්

සී. එම්. මද්දුම බණ්ඩාර - පේරාදෙණිය සරසවිය



### අපවිත්‍ර ගංගා

කුඩා දරුවන් වශයෙන් දිවයිනේ සෑම ගංගාවකම ඇළකම, දොළකම, කඳුරකම බැස දිය නාමින් විනෝදමත් වූ යුගයක් අපට විය. ඒවායේ ජලය බීමට ගැනීමට පවා බාධාවක් නොවීය. එහෙත් අද අප "සංවර්ධනය" යැයි කියන අදියරයකට ළඟා වී ඇති අතර හාරන ලද ළිං, නළ ළිං, දිය උල්පත් ආදී කිසිදු විවෘත ජල තලයක ජලය බීමට ගැනීමට නොහැකි තත්ත්වයක් උදා වී ඇත. කොළඹ බේරේ වැවේ සහ අධික ලෙස දූෂණයට ලක්වී ඇති මහනුවර මැද ඇළේ ජලය ප්‍රයෝජනයට ගැනීමද වත්මන් පරපුරට තහනම්ය. බොහොමයක් මිරිදිය ජලාශ වලට ඝන අපද්‍රව්‍ය, කෘෂි රසායන ද්‍රව්‍ය සහ කර්මාන්ත වලින් පිට කරන අපද්‍රව්‍ය බැහැර කිරීම නිසා, මිරිදිය මසුන්, උරගයන් හා ඇතැම් පැලෑටි විශේෂද අධික ලෙස විෂ සහිත තත්ත්වයට පත් වී ඇති අතර එවැනි ජලාශ ජෛව විවිධත්වය අතින් දිළිඳු තත්ත්වයකට පත්ව ඇත. අධික වශයෙන් වැලි ගොඩ දැමීම හේතු කොටගෙන ගංගා පතුල ගැඹුරු වීමත් එමගින් ඉවුරු බිඳ වැටීමත් සිදුවී ඇති අතර තවත් ගැටළු රැසකටම මං පාදා ඇත.

මේ සම්බන්ධයෙන් අපට කළ හැක්කේ කුමක්ද ? අපේ අනාගත පරපුරට මේ ජල සම්පත් භුක්ති විඳීමටත් ඒවායේ ස්වභාවික සෞන්දර්යය විඳ ගැනීමටත් හැකිවන පරිදි ඒවා නැවත පවිත්‍ර කළ හැකිද ? සැලකිය යුතු කාල පරිච්ඡේදයක් ඇතුළත එය සිදු කළ හැකිය. ගංගා ඇතුළු අනෙකුත් ජල ව්‍යුහ පවිත්‍ර කිරීමෙහි ලා නිසි මග පෙන්වීමක් ලැබෙන්නේ නම් සහ ඒ සම්බන්ධයෙන් දැඩි වගකීමක් පැවරෙන්නේ නම් එය අසීරු කටයුත්තක් නොවන බව ඔප්පු කිරීමට අසල්වැසි රට වලින්ද සාක්ෂි ලබාගත හැකිය.


### දේශපාලන නායකත්වයට කළ හැකි දේ බොහෝය - සිංගප්පූරුවෙන් පාඩමක් -

1977 මුල් භාගයේදී, එනම් ඉහළ විනිවිදුම් ජලාශය (Upper Price Reservoir) විවෘත කිරීමේදී, සිංගප්පූරුවේ එවකට සිටි අග්‍රාමාත්‍යවරයා, ලී කුආන් යිව් මහතා මෙසේ ප්‍රකාශ කළේය. "ජලය පිරිසිදුව තබා ගැනීම, එනම්, සෑම ජල මාර්ගයක්ම, සෑම දිය අගලක්ම දූෂණයෙන් වළක්වා ගැනීම ජීවිතයේම අංගයක් විය යුතුය. පරිසර අමාත්‍යාංශය එය ඉලක්ක කළ යුතුය. වසර දහයක් ඇතුළත දී සිංගප්පූරු ගංගාවේ සහ කලාන්ග් ද්‍රෝණියේ මසුන් මැරීම කළ යුතුය. එය කළ හැකිය."


1977 ඔක්තෝබර් වන විට සැලසුම් සකස් කරන ලද අතර සිංගප්පූරු ගංගාව සහ කලාන් ද්‍රෝණිය පවිත්‍ර කිරීමට ක්‍රියා මාර්ග ගන්නා ලදී. මෙම ප්‍රයත්නයේ මූලික අරමුණ වූයේ කලාන්ග් ද්‍රෝණිය සහ සිංගප්පූරු ගංගාව හා සම්බන්ධ වන ගංගා පවිත්‍ර කර ඒවායේ ජලජ ජීවය ඇති කිරීමයි. විශාල නිවාස සංවර්ධනයන් ද ඇති වූ අතර පවුල් 26,000 කට වඩා වැඩි සංඛ්‍යාවක් කාණු පද්ධති රහිත ගොඩනැගිලි වල ජීවත් වූහ. ඒවා පිටුපස සහ නිවාස තුළ කර්මාන්ත 2800 ක් පමණ නැවත ස්ථාපිත කරනු ලැබිණි. ගංගා පවිත්‍ර කිරීමේ වැඩසටහන මගින් ගනු ලැබූ අනෙකුත් ක්‍රියාමාර්ගය වනුයේ, පදික වෙළෙන්දන් නැවතත් ආහාර ද්‍රව්‍ය විකුණන මධ්‍යස්ථාන වලට යොමු කිරීම, දූෂණයට හේතුවන ක්‍රියාකාරකම් නතර කිරීම සහ අනවසර පදිංචිකරුවන්, කර්මාන්ත වැඩ පොළවල්, නිවාස පිටුපස පවත්වාගෙන යන වෙළඳාම්, කර්මාන්ත සහ ගොවියන් නැවතත් ස්ථාපිත කිරීම ආදියයි.

ගංගා පවිත්‍රව තබා ගැනීම සඳහා, ගංගා දූෂණය වැළැක්වීමේ වැඩසටහන් සැලසුම් කිරීම, සම්බන්ධීකරණය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා රජයේ විවිධ අමාත්‍යාංශ සහ ප්‍රාථමික නිෂ්පාදන දෙපාර්තමේන්තුව, නිවාස සංවර්ධන මණ්ඩලය, ජුරෝන් නගර සංස්ථාව, නාගරික සංවර්ධන අධිකාරිය, කැළිකසළ පිළිබඳ දෙපාර්තමේන්තුව, පදික වෙළෙඳුන් පිළිබඳ දෙපාර්තමේන්තුව, ජල පවාහන දෙපාර්තමේන්තුව, පාරිසරික සෞඛ්‍යය, උද්‍යාන සහ ප්‍රතිනිර්මාණය කිරීමේ දෙපාර්තමේන්තුව වැනි විවිධ ව්‍යවස්ථාපිත මණ්ඩල වලින් යුත් කමිටුවක් පත් කරන ලදී. ගංගා දූෂණය අවම කිරීමේ එක් ප්‍රධාන වැඩ පිළිවෙළක් වන්නේ සකසන ලද උපාය මාර්ග යොදා ගැනීමයි. මෙවැනි උපාය මාර්ග වලට

* කැළි කසළ එකතුවීමට වඩාත් ඉඩකඩ ඇති ප්‍රදේශ වල කාණු පද්ධති ඝනකම් තහඩු වලින් ආවරණය කිරීම මගින් ඒවාට කැළිකසළ එකතුවීම වැළැක්වීම,







* ප්‍රධාන ඇළ මාර්ග සහ ගංඟා වලට යොමුවන තෝරාගත් කාණු පද්ධති වල සිරස් අතට යකඩ කූරු සහිත රාමු යෙදීම,

* ගංඟා සහ ඇළ මාර්ග හරහට පාවෙන බාධක යෙදීම ආදිය ඇතුළත් වේ.

සිංගප්පූරු ගංඟාව සහ කලාන්ග් ද්‍රෝණිය පවිත්‍ර කිරීමේ කටයුතු පරිසරය ප්‍රකෘතිමත් කිරීමෙහි ලා පාඩමක් පෙන්නුම් කරයි. 1977 දී ඇරඹි මෙම ව්‍යාපෘතිය නිමවීමට වසර 10ක් ගතවිය. කැළිකසළ වලින් පිරී දුර්ගන්ධය හමමින් අධික ලෙස දූෂණයට ලක්ව තිබූ ගංඟාවක් අද ජලජ ජීවීන් වෙසෙන්නා වූ පවිත්‍ර ගංඟාවක් බවට පරිවර්තනය කිරීමට මෙමගින් හැකිවී ඇත.

සිංගප්පූරුව වෙළෙඳ සහ ව්‍යාපාරික මධ්‍යස්ථානයක සිට ශීඝ්‍ර නාගරීකරණයෙන් සහ පුළුල් වන වෙළඳපොළකින් යුත් ස්ථානයක් දක්වා සංවර්ධනය වීම සිංගප්පූරු ගඟ සහ කලාන් ද්‍රෝණිය මගින් සළකුණු කෙරේ. 1960 සිට 1980 දක්වා කාල පරිච්ඡේදය තුළදී, ගංඟාව වටා ව්‍යාපාරික සහ වෙළෙඳ කටයුතු ව්‍යාප්ත වීම නිසා පාලනයකින් තොරව ගංඟාවට සහ ද්‍රෝණියට බැහැර කරනු ලැබූ සියලුම අපද්‍රව්‍ය සහ අපවිත්‍ර ජලය හේතුවෙන් විශාල දූෂණයක් ඇතිවිණි. ගංඟාවට සහ ද්‍රෝණියට අපද්‍රව්‍ය වූයේ ඌරු සහ තාරා ගොවිපොළවල් වලින් බැහැර කරන අපද්‍රව්‍ය, කාණු පද්ධති රහිත ගොඩනැගිලි, පදික වෙළෙඳුන්, ගං ඉවුරු ආශ්‍රිත ක්‍රියාකාරකම්, එළවළු තොග වෙළෙඳ කටයුතු ඇතුළු අනෙකුත් දේය.

වත්මනේ, මෙම ගංඟාව සහ ද්‍රෝණිය බෝට්ටු පැදීම, මසුන් මැරීම සහ විනෝද සවාරි ආදිය සඳහා යොදාගන්නා අතර මෙයින් සිංගප්පූරු වැසියාගේ ජීවන තත්ත්වය ද ඉහළ නැංවී ඇත. ආර්ථික හා සමාජ සංවර්ධනයක් ද සළකුණු කරමින් මෙම ප්‍රදේශ අවට ඉඩම් මිලද ඉහළ ගොස් ඇත. ගංඟාව ඉදිරිපිට තානායම් පවත්වාගෙන යාම වැනි කටයුතුද දැන් ඇරඹී ඇත. සිංගප්පූරුවේ අරමුණු මුදුන් පමුණුවා ගැනීම වූ කලී, දැඩි දේශපාලනික කැමැත්ත සහ මගපෙන්වීම යටතේ ඉටු කරගනු ලැබූ තාක්ෂණික ප්‍රයත්නයකි.

රජයේ සිංගප්පූරු ගංඟා සංවර්ධන සැලසුම වන්නේ, 21 වන සියවස වන විට එම ගංඟාව විනෝදාත්මක සහ සංස්කෘතික ක්‍රියාකාරකම් සඳහා ජනයා එක්රැස් වන ප්‍රදේශයක් බවට පත් කරලීමයි. නූතන නාගරික සිංගප්පූරුවේ පිළිබිඹුවක් වන මධ්‍යම ව්‍යාපාරික දිස්ත්‍රික්කයේ උස් මහල් ගොඩනැගිලි වල පසුබිම වඩාත් සෞන්දර්යාත්මක කරනු වස් බොහෝ දේ සිදු කෙරෙමින් පවතින බැවින් මෙම කාරණය ඉෂ්ට වෙමින් පවතී.

### ඉන්දියාවේ අත්දැකීම්

ඉන්දියාවේ අභ්‍යන්තර ජලයේ ගුණාත්මක බව රැකගැනීම සඳහා පාරිසරික හා වන සම්පත් අමාත්‍යාංශය මගින් වැඩසටහන් කිහිපයක් සැලසුම් කර ඇත. මධ්‍යම දූෂණ පාලන මණ්ඩලය මගින් සපයනු ලබන දත්ත මත පදනම්ව, ඉන්දියානු මිනින්දෝරු දෙපාර්තමේන්තුව මගින් ඉන්දියානු ජල ගුණාත්මක සිතියමක් සකසා ඇත. ගංඟා නම් ගඟේ ජලයේ ගුණාත්මක බව වැඩිදියුණු කිරීම සඳහා, 1986 දී ගංඟා ක්‍රියාත්මක සැලැස්ම ආරම්භ කළ අතර එම ගංඟාව දිගට පිහිටුවා ඇති කර්මාන්ත දහස් ගණනක් වසා දැමීමට හෝ ඒවායින් බැහැරලන ද්‍රව්‍ය ප්‍රමිතියකින් යුතුව බැහැරලීමට හෝ නියම කෙරිණි. ගංඟා ක්‍රියාත්මක සැලැස්මේ I වන සහ II වන අදියර වලින් ආවරණය නොවන ගංඟා වල සම්පූර්ණ වශයෙන් දූෂණයට ලක්වූ ජල තීරු ජාතික ගංඟා ක්‍රියාත්මක සැලැස්මට ඇතුළත් වේ. ගංඟා 09 ක සම්පූර්ණ වශයෙන්ම දූෂණය වූ ජල තීරු 14 ක් ද තවත් ගංඟා අටක අඩුවෙන් දූෂණය වූ තීරු 14 ක් ද හඳුනාගෙන ඇත.

### නිදර්ශනයක් වශයෙන් – මලයාසියාව

ප්‍රතිදූෂණ පිළිබඳ ව්‍යවස්ථාදායකයක් පවතින ආසියානු පැසිෆික් කලාපයේ රටවල් බොහොමයක් අතරින්, දූෂණය පාලනය කිරීමේ මට්ටම සැළකූ විට, ඊට හොඳම නිදර්ශනය ලෙස ගත හැක්කේ මලයාසියාවයි. මලයාසියාවේ විවිධ රෙගුලාසි සහ පනත් වලට සංශෝධිත ජල පනත, (ගංඟා දූෂණය පාලනය කිරීම සඳහා) වීදි, ජල පවාහන සහ ගොඩනැගිලි පනත (කාර්මික අපද්‍රව්‍ය සහ ගෘහ අපද්‍රව්‍ය ගංඟා වලට බැහැර කිරීම පාලනය කිරීම සඳහා) සහ පළාත් පාලන පනත (පළාත් අධිකාරියේ ප්‍රදේශ ඇතුළත ගංඟා දූෂණය පාලනය කිරීම සඳහා) ආදිය ඇතුළත් වේ. (මලයාසියාව, 1992 සහ 1993).

### ඉන්දුනීසියාවේ අත්දැකීම්

ඉන්දුනීසියාවේ දෙවන විශාලතම නගරය වන "සුරබයා" නගරයේ Prokasih වශයෙන් පවිත්‍ර





ගංගා පිළිබඳ වැඩසටහනක් ක්‍රියාත්මක වේ. එහි අරමුණ වන්නේ කර්මාන්ත වල දූෂකයන් වෙත මහජන හා දේශපාලනික බලපෑමක් එල්ල කිරීමයි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන්, බොහෝ කර්මාන්ත මගින් අපද්‍රව්‍ය පවිත්‍ර කරන යන්ත්‍රෝපකරණ ඉදිකර ඇති අතර, ඇතැම් අවස්ථා වලදී බැහැරලන අපද්‍රව්‍ය ප්‍රමාණය 50% කට වඩා පහත වැටී ඇත.

Program Kali Berish (පවිත්‍ර ගංගා වැඩසටහන) යන්නෙන් සකසා ඇති 'Prokasih' යනු, ගංගා වල ජලයේ ගුණාත්මක බව වැඩිදියුණු කිරීමෙහි ලා ඉලක්ක කොට සකසන ලද ගංගා දූෂණය වැළැක්වීමේ යෝජනා සමූහයකට දෙන ලද නමයි. මෙම වැඩසටහන මගින් ගංගා ජලය අඛණ්ඩ ලෙස ප්‍රයෝජනයට ගතහැකි වනු ඇත. ගංගා වලට සෘජුවම බැහැර කරන ද්‍රවමය අපද්‍රව්‍ය හා අපජලය ප්‍රමාණය පහත හෙළීමෙන් මෙම අරමුණු ඉටුකර ගැනේ.

ආර්ථික ක්‍රියාකාරකම් සඳහා ද්‍රවමය අපද්‍රව්‍ය වල ගුණාත්මක ප්‍රමිති පිළිබඳ දැනටමත් රෙගුලාසි පවතී. ඒවා මගින් ද්‍රවමය අපද්‍රව්‍ය හා අප ජලය සම්බන්ධයෙන් ලබාදිය හැකි උපරිම මට්ටම් ලබා දේ. 1982 දී, පරිසර දූෂණය පාලනය කිරීම පිළිබඳ සැලසුම සකස් කරන ලදී. පළාත් අට ගංගා 20ක් පදනම් කොටගත 'PROKASIH' වැඩසටහන 1989 දී ඇරඹිණි. 1990 දී, එහි ඉලක්කය පළාත් 11ක ගංගා 24ක් දක්වාද, 1994 දී පළාත් 13 ක ගංගා 29 ක් දක්වාද ඉහළ නැංවිණි. අවසාන වශයෙන් මෙම වැඩසටහනට පළාත් 11ක ගංගා 30ක් ඇතුළත් විණි.

PROKASIH වැඩසටහන පළාත් ආණ්ඩු මගින් ක්‍රියාත්මක කෙරෙන අතර ස්වදේශීය කටයුතු පිළිබඳ අමාත්‍යාංශය හා අනෙකුත් අදාළ නියෝජ්‍යායතන මගින් ජාතික වශයෙන් සම්බන්ධීකරණය කෙරේ. පළාත් මට්ටමේදී, මෙහි කටයුතු පවත්වාගෙන යනු ලබන්නේ, ආණ්ඩුකාරවරයා විසින් පිහිටුවන ලද කණ්ඩායමක් මගිනි. ප්‍රාදේශීය ප්‍රවේශය මගින්, ප්‍රාදේශීය ව්‍යාපාර මෙන්ම, ජාතික ප්‍රවර්ධනය තුළින් ප්‍රජාවගේ සහ කණ්ඩායම් වල අවබෝධය වැඩිදියුණු කිරීමට එය උත්සාහ දරයි. පාරිසරික රාජ්‍ය නොවන සංවිධානද මේ වැඩසටහනට සමීප ලෙස සම්බන්ධ වී ඇත. ප්‍රජාවගේ සහ පෞද්ගලික සමාගම් වල අවබෝධය ඇතිකිරීමෙහි ලා මෙම PROKASIH වැඩසටහන සාර්ථක ව්‍යාපාරයකි.

මෙම ව්‍යාපෘතිය, රජය, ප්‍රාදේශීය රජය, විශ්ව විද්‍යාල සාමාජිකයන්, මාධ්‍යවේදීන්, රාජ්‍ය නොවන සංවිධාන සහ ප්‍රජාව අතර සම්බන්ධතා සම්මිශ්‍රණය කරන සාර්ථක සහ අත්‍යවශ්‍ය වැඩසටහනකි. රජයේ සංවිධානාත්මක සහභාගිත්වය සහ මධ්‍යගත සම්බන්ධීකරණය මගින් ජනතා සහභාගිත්වය පිළිබඳ උත්සාහය පහසුවෙන්ම වෙනත් අතට හැරවිය හැකිය. කෙසේ වෙතත්, ඇතැම් රාජ්‍ය නොවන සංවිධාන සහ විශ්ව විද්‍යාල නිහඬ ලෙසත්, ස්වාධීන ලෙසත් අඛණ්ඩව වැඩ කරති. අවසාන වශයෙන්, පොරොන්දු වලට සහාය සැපයීම සහ පවත්නා ක්‍රමය විමධ්‍යගත කිරීම සඳහා ප්‍රතිපත්ති වෙනස් කිරීම සඳහා, මෙම වැඩසටහනට සහභාගි වන සෑම කණ්ඩායමක්ම දිරිමත් කළයුතු බව රජය විශ්වාස කරයි.


මෙම ව්‍යාපෘතිය ප්‍රජාවගේ සහ ගංගා ඉවුරු දිගට පිහිටුවා ඇති සමාගම් වල සදාචාරාත්මක පෙළඹවීමක් ඉහළ නැංවීමට ක්‍රියාකාරී ලෙස ප්‍රයත්න දරයි. ප්‍රාදේශීය ක්‍රියාකාරකම් සඳහා රාජ්‍ය නොවන සංවිධාන සහාය ලබාදෙයි. ව්‍යාපාරික කටයුතු සඳහා මෙම වැඩ සටහන මගින් වර්ගකිරීම් භාවිත කෙරේ. හොඳම කාණ්ඩයේ සිට නරකම කාණ්ඩය දක්වා ශ්‍රේණි වර්ණ (රන්, කොළ, නිල්, රතු, කළු) මගින් පෙන්නුම් කෙරේ. ගුණාත්මක ප්‍රමිති හා සම්බන්ධ මට්ටම් පෙන්නුම් කිරීමට මෙම වර්ගකිරීම් උපයෝගී කර ගැනේ. මෙවැනි වර්ගකිරීමේ ක්‍රමයක් පැවතීමෙන්, යම් සමාගමකට එහි ගුණාත්මකභාවය වර්ධනය කරගත හැකි අතර, දේශීය හා අන්තර්ජාතික තරඟකාරී වෙළඳ පොළ කරාද පහසුවෙන් ප්‍රවේශ විය හැකිය.

## ශ්‍රී ලංකාවේ මූලික ගැටලු

ශ්‍රී ලංකාව සමාජීය වශයෙන් පිළිගැනීමකට හා තිරසාර බවකට පත් කළ හැකි අන්දමේ යථාර්ථවාදී සහ රටට ආවේණික වූ වැඩසටහනක් සැකසීමට ගංගා දූෂණය හා සම්බන්ධ මූලික ගැටලු වල ස්වභාවය හා ප්‍රමාණය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට අවශ්‍ය වේ. මෙසේ පසුගිය ශත වර්ෂ 1 1/2 ක කාලයක් මුළුල්ලේ, ව්‍යවස්ථාදායක පනත් බොහොමයක් හඳුන්වා දී ඇතද, විශේෂයෙන්ම පසුගිය දශක කීපය තුළ, ඒකඟතාවය නොමැති කම හා දුර්වල බලපැවැත්වීම දැවසට නියම වැඩ කොටස බවට පත්ව ඇත. ස්වභාවික සම්පත් කළමනාකරණය හා සම්බන්ධ පනත් අවම වශයෙන් 51 ක් පමණ ශ්‍රී ලංකාවේ ඇත. එකිනෙකා අතර බෙදී ගිය වගකීම්,







ආයතනික ප්‍රතිපත්ති ප්‍රකාශ වල අර්බුදකාරී තත්ත්වය සහ රජයේ බොහොමයක් පරිපාලනමය ස්තර මගින් ජල දූෂණය සහ හං ඉවුරු හායනය හා සම්බන්ධ වර්තමාන රාජ්‍ය කටයුතු වලට දායක වී ඇත.

ගංගා වලට සිදුවී ඇති ව්‍යුහ විද්‍යාත්මක හා ජල විද්‍යාත්මක වෙනස්කම් පැහැදිලිය. හං ඉවුරු වලට සහ පතුල් වලට හානි පැමිණෙන ප්‍රධාන හේතු වන්නේ වැලි ගොඩදැමීම හා මැටි කැපීමයි. වර්ෂයකට වැලි කියුබික් මීටර දස ලක්ෂ 3.82 ක් (කියුබි දස ලක්ෂ 1.3) පමණ ගොඩදමන බව ඇස්තමේන්තු කර තිබේ. නාගරික ප්‍රදේශ වල ඝන අපද්‍රව්‍ය ගොඩගැසීම නිසා හං වතුර ඇතිවන අතර ජලයේ ගුණාත්මක බවද හීන වේ. ව්‍යවස්ථාදායකමය සහ පරිපාලනමය පාලනය කිරීම් පැවතියද, ගංගා වලට කාර්මික අපද්‍රව්‍ය මුදාහැරීම නොනවත්වාම සිදු කෙරේ. බස්නාහිර ප්‍රදේශයේ පවතින ගංගා සැලකිල්ලට ගත් කළ, ගංගා වලට මිනිසාගේ බලපෑම නිසා ඇතිවී තිබෙන ප්‍රතිඵල පැහැදිලිය. කැළණි ගඟෙන් හා එහි අතු ගංගා වලින් ගොඩදමන වැලි මත සමස්ත කොළඹ නගරයම පාහේ ගොඩනැගී ඇති බව දන්නේ සුළු පිරිසකි. වත්මනේ මා ඔයෙන් වාර්ෂිකව ගොඩදමන වැලි ප්‍රමාණය කියුබි 431575 ක් වන අතර එය වැලි ගොඩදැමීම සිදුකරන ගංගා ලැයිස්තුවේ ඉහළින්ම පවතී. වේළි බැඳීමෙන් ආදිය ගමන් මග වෙනසකට ලක් කරනු ලැබ ඇති විශාලම ගංගා ද්‍රෝණියක් සහිත මහවැලි ගඟ තව දුරටත් හායනයට ලක්වීමෙන් වැළැක්වීමට ඉක්මන් පියවර ගත යුතු වේ.

වැලි ගොඩදැමීමෙන් ඇතිවන බලපෑම කෙරෙහි ප්‍රථමයෙන් අවධානය යොමු වූයේ එමගින් වෙරළෙහි ස්ථායීතාවයට ඇති වූ හානිදායක ප්‍රතිඵල හේතු කොටගෙනය. පසුව, ගංගා ගොඩ ගැලීම, ගංගා වලට ලවණ ජල ය කාන්දු වීම ආදී අනෙකුත් බරපතල බලපෑම් දැඩි වශයෙන් ඇති විය. කැලණි ගං පත්ල සැළකිය යුතු මට්ටමෙන් පහත් වීමට ලක්ව ඇති අතර, වියළි කාල වලදී ඉන් පානීය ජලය ලබාගැනීම තාවකාලිකව නැවැත්වීමට මං පාදා ඇති අතර, ශ්‍රී ලංකාවේ හං මෝයවල් ගණනාවකට ලවණතාව වළක්වන බාධක ඉදිකිරීමට හෝ එවැනි ඉදිකිරීම් සැලසුම් කිරීමට පොළඹවා ඇත. නිල්වලා ගඟේ ජල සැපයුම පද්ධතිය කිහිපවරක්ම ගංගාවේ ඉහළ පිහිටීම් වලට ගෙනයෑමට සිදුවිය. වැලි ගොඩදැමීම සහ මැටි කැපීම මගින් පාරිසරික ගැටලු ගණනාවක් ඇති වී ඇති අතර එමගින් ලවණ ජලය කාන්දු වීම, හං ඉවුරු වල ස්ථායී බවට හානි වීම සිදු වී ඇති අතර ප්‍රවාහන ක්‍රම වලට පවා එමගින් බලපෑම් ඇති වී ඇත. එබැවින් පරිසරයට සිදුවන සියලුම ආකාරයේ දූෂණ රටාවන්, ගංගා පතුල් හා ඉවුරු හායනය වීම, ඝන හා ද්‍රවමය අපද්‍රව්‍ය බැහැර කිරීම් ආදිය ඉක්මනින් හඳුනා ගැනීමටත්, එවැනි තත්ත්වයන්ට ප්‍රතිකර්ම සැලසීමට පවත්නා නීති හැකි උපරිම අයුරින් උපයෝගී කරගැනීමත් අවශ්‍ය වේ. එසේම අධ්‍යාපනය හා අවබෝධය තුළින් ජනතා සහභාගිත්වය ලබාගැනීමට අවශ්‍ය වේ.

**ශ්‍රී ලංකාවේ උපාය මාර්ගය : පවිත්‍ර ගංගා ව්‍යාපාරය**

වසර 10 ක් වැනි කාලයක් තුළදී ශ්‍රී ලංකාව තුළ පවිත්‍ර ගංගා සහ ජල ව්‍යුහ ඇති කිරීම යන ඉලක්කය ඉටුකර ගැනීමට නම්, ශ්‍රී ලංකාවටම ආවේණික වූ ප්‍රතිපත්තියක් ඇති කළ යුතුය. ඇතැම් වලංගු කළහැකි ව්‍යවස්ථාදායක මගින් අනුබල දෙනු ලබන දූෂකයන් වෙතට මහජන සහ දේශපාලනික බැලපෑම එල්ල කළහැකි උපාය මාර්ගයක් විය යුතුය. එය ප්‍රධාන පාර්ශ්වකරුවන් එක්ව ක්‍රියාත්මක වන සහභාගිත්ව ප්‍රවේශයක් විය යුතුය. මෙම උපාය මාර්ගය අපගේ ගංගා පද්ධති පවිත්‍ර කිරීම මෙන්ම දූෂණය හා සමීප ලෙස සම්බන්ධ වන ප්‍රබල ස්ත්‍රී-පුරුෂ සම්පත් වලින් සමන්විත විය හැකිය. ඵලදායී සහභාගිත්ව ප්‍රවේශයක් ඇති කරලීමට නම්, ශ්‍රී ලංකාවේ ජලය හා සම්බන්ධ වන ක්‍රියාකාරකම් පිළිබඳව කටයුතු කරන ආයතන වල විවිධත්වය බාධකයක් ලෙස නොව ආශිර්වාදයක් ලෙස සැළකිය යුතුය. සෑම පාර්ශ්වයක්ම සතුව ඇති වගකීම් හා කටයුතු පිළිබඳව පැහැදිලි විස්තර සටහනක් තිබිය යුතුය. පවිත්‍ර ගංගා සඳහා ශ්‍රී ලංකාවේ ව්‍යාපාරයට මධ්‍යම විධාන ව්‍යුහයක් සහ තදින්ම දේශපාලනික අනුබලයක් ඇති ශක්තිමත් නායකත්වයක්ද අවශ්‍ය වේ.

මධ්‍යම පරිසර අධිකාරියේ නායකත්වය යටතේ ඉක්මනින්ම විශේෂ කාර්ය බලකායක් පිහිටුවීමට යෝජනා කරනු ලැබූ අතර, එය දූෂණය පාලනය කිරීම සහ ගංගා සම්බන්ධ පාරිසරික ගැටලු සම්බන්ධයෙන් ක්‍රියාත්මක සැලැස්මක් ක්‍රියාත්මක කරනු ඇත. ගංගා ඉවුරු කළමනාකරණයෙහි ලා රාජ්‍ය ආයතන වල වගකීම් සහ වසර ගණනාවක් තිස්සේ පාරිසරික ගැටලු ඒකරාශි කිරීමට හේතු වූ පවත්නා නීති සහ කොන්දේසි පැනවීමෙහි ලා ඔවුන් මුහුණපාන ගැටලු ද හේතුවෙන් විශේෂ කාර්ය බලකායක අවශ්‍යතාවය තදින්ම දැනුණි.



අදාළ නියෝජ්‍යායතන විසින් මෙම විශේෂ කාර්ය බලකාය නියෝජනය කරනු ඇත. අමාත්‍යාංශ නියෝජිතයන් ඉතාමත් ජ්‍යෙෂ්ඨ මට්ටමක සිටිය යුතු අතර, අනෙකුත් නියෝජ්‍යායතන සහ අතිරේක ලේකම්ගේ නියෝජනය අදාළ සංවිධානයේ ප්‍රධානියා හෝ දෙවන ප්‍රධාන ජ්‍යෙෂ්ඨ නිලධරයා විය යුතුය.


* මධ්‍යම පරිසර අධිකාරිය
* වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යාංශය
* පාරිසරික හා ස්වභාවික සම්පත් අමාත්‍යාංශය
* පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය
* සෞඛ්‍ය අමාත්‍යාංශය
* ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය
* ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව
* පොලිස් දෙපාර්තමේන්තුව
* විගණකාධිපති දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙක්
* පාර්ලිමේන්තු මණ්ඩල හරහා පෞද්ගලික අංශ නියෝජනය
* ප්‍රධාන රාජ්‍ය නොවන සංවිධාන දෙකක නියෝජනය
* ප්‍රජා පාලක සංවිධාන දෙකක නියෝජනය
* ප්‍රධාන වෘත්තීය ආයතන දෙකක නියෝජිත යෝ
* විශ්ව විද්‍යාල නියෝජිතයෝ දෙදෙනෙක්
* අමාත්‍යවරුන් දෙදෙනෙකු විසින් නම්කරනු ලැබූ දේශපාලනික නියෝජිතයෝ
* නාගරික සංවර්ධන අධිකාරිය, ජාතික ජල සම්පත් අධිකාරිය, ආයෝජන මණ්ඩලය, ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීම් සහ සංවර්ධන දෙපාර්තමේන්තුව, වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම දෙපාර්ත-මේන්තුව, භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය සහ අනෙකුත් අදාළ රාජ්‍ය නියෝජ්‍යායතන ආදියෙහි නියෝජිතයෝද අවශ්‍ය වූ විටෙක අවශ්‍ය අවස්ථා වලදී මීට ඇතුළත් කරගනු ලැබෙති. ගංගා පරිහානිය සම්බන්ධ ගැටලු හදිසි කරුණු වල යෙදීම, ඉක්මනින් ප්‍රතිචාර දක්වනු වස් වගකිවයුතු රාජ්‍ය නියෝජ්‍යායතන ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය උපදෙස් නිකුත් කිරීමට සහ ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට ආදි මෙම විශේෂ කාර්ය බලකාය යම් කාලයක් ගනු ඇත.

අවශ්‍ය තාක්ෂණික පසුබිමක් සහිත නිලධරයන් කිහිප දෙනෙකුගෙන් යුත් ලේකම් කාර්යාලයක් මධ්‍යම පරිසර අධිකාරිය යටතේ පිහිටවනු ඇත. මෙය විශේෂ කාර්ය බලකාය සඳහා මෙහෙයුම් මධ්‍යස්ථානයක් වශයෙන් ක්‍රියාකරනු ඇති අතර නුවර පොල්ගොල්ල මහවැලි අධිකාරියේ පරිසර හා වන සම්පත් අංශය සමග සමීප සහයෝගයෙන් යුතුව ක්‍රියා කරනු ඇත.

## විශේෂ කාර්ය බලකාය සඳහා පැහැදිලි කාර්යභාරයක්

* ජලය දූෂණය වන සියලුම මාර්ග සහ එවැනි දූෂණ වලට හේතුවන දේ හඳුනා ගැනීම.
* පවත්නා නීති සහ කොන්දේසි ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට සහ, ගංගා පද්ධති වල ජලයේ ගුණාත්මක බව වැඩි දියුණු කිරීමට අදාළ වන සම්පත් සංවිධානය කිරීම සඳහා පහසුකම් සැපයීම.
* අදාළ නීති හා කොන්දේසි බලපැවැත්වීම හෝ එසේ බලපැවැත්වනු ලැබීමට හේතු පැනවීම සහ එකඟතාව මෙහෙයවීම.
* ජල කළමනාකරණය සඳහා වගකිවයුතු අදාළ නියෝජ්‍යායතන සහ පුද්ගලයන් රඳවා ගැනීමට ක්‍රමවේදයක් සැකසීම.
* මහජන සහ දේශපාලන බලපෑම් මගින් ගංගා ආශ්‍රිත පරිසර පද්ධති ආරක්ෂා කිරීමට, සංරක්ෂණය කිරීමට, ප්‍රතිනිර්මාණය කිරීමට සහ මෙහෙයවීමට අදාළ නියෝජ්‍යායතන ඇති කිරීම.
* ගංගා දූෂණ ගැටලු තීව්‍ර කිරීම හා සම්බන්ධ තොරතුරු ලබාගැනීම සඳහා යාන්ත්‍රණයක් සැකසීම හා ඉක්මන් ප්‍රතිචාර ක්‍රමයක් සැකසීම.
* ගංගා වල සහ අනෙකුත් ජල ව්‍යූහ වල පවිත්‍රතාවය සහතික කිරීමට අවශ්‍ය සුදුසු සමාජීය, ආර්ථික සහ තාක්ෂණික ක්‍රම යොදා ගැනීම.
* ජල දූෂණය වැළැක්වීම සඳහා තම ඉපයීම් වලින් කොටසක් වෙන් කිරීමට ජලය හා සම්බන්ධ ව්‍යාපාර වලට ඉඩ හැරීම.
* අධ්‍යාපනය සහ අවබෝධය මගින් පවිත්‍ර ගංගා සංකල්පය පිළිබඳ දැක්ම වැඩිදියුණු කිරීම සහ ප්‍රජා සහභාගිත්වය සුරැකීම.

මෙවැනි රජයේ කඩිනම් වැඩසටහන් වලින් ලබාගත් සැලකිය යුතු මට්ටමේ ජයග්‍රහණය පිළිබඳ අතීත අත්දැකීම් සැලකිල්ලට ගැනීමෙන්, ඊට







අනුබලයක් වශයෙන් රජයේ පූර්ණ බලපෑම සහතික කරන බලයක් මෙම පවිත්‍ර ගංගා විශේෂ කාර්ය බලකායට ලබාදිය යුතු බව පිළිගැනේ.

## පවිත්‍ර ගංගා : අනාගතය පිළිබඳ පෙරදැක්මක්

මධ්‍යම කඳුකරයෙන් ඇරඹී දසත විහිදී යන ගංගා 103 ක් ශ්‍රී ලංකාව සතු වේ. ඕනෑම ගංගා ද්‍රෝණි පිළිබඳ උපාය මාර්ගයක් මගින් මෙම අද්විතීය ජල භූ විද්‍යාත්මක පිහිටීම පිළිබඳ සැළකිල්ලට ගතයුතු අතර, ජලය හා සම්බන්ධ සියලුම ක්‍රියාකාරකම් ඒ අනුව සැලසුම් කළ යුතු වේ. මේ සෑම ද්‍රොණියක් සඳහාම ගංගා ද්‍රෝනි සංවිධානයක් ඇති කරලීම යථාර්ථවාදී නොවන බැවින් හා දුෂ්කර බැවින් යම් විචාරශීලී පදනමක් මත මෙම ගංගා ද්‍රෝණි පොකුරු කිරීමට යෝජනා කර ඇත. මෙම ලේඛකයාද විශාලතම ගංගා ද්‍රෝණිය වන මහවැලි ද්‍රෝණියට විශාලත්වයෙන් සමාන එබඳු පොකුරු 7 ක් පිළිබඳව යෝජනා කළේය. මෙසේ පැහැදිළි කරන ලද ප්‍රදේශ 7, සම්පූර්ණයෙන්ම ගංගා ද්‍රෝණි දිය බෙත්ම මත පදනම් වූ අතර, අතීතයේදී මෙන් කිසිදු භූමි අවහිරයකින් තොරව මුහුදට ප්‍රවේශ විය. අධිරාජ්‍යවාදී අවශ්‍යතා පමණක් සපුරාලන, අධිරාජ්‍යවාදී සමයේ සකස් කරන ලද අංශ වෙතම ඇලීගැලී සිටිනවාට වඩා ගංගා ද්‍රෝණි මත පදනම් වූ අපේම පරිපාලන සහ සංවර්ධන ප්‍රදේශ නැවත බෙදා දැක්වීම වඩාත් සුභදායක බව මෙම ලේඛකයා තවදුරටත් ප්‍රකාශ කළේය.

ජාතික ජල සම්පත් ප්‍රතිපත්තිය (ජල සම්පත් ලේකම් කාර්යාලය, 2000) මගින්, ස්වභාවික ගංගා ද්‍රෝණිය, ඒකාබන්ධ ජල සම්පත් සැලසුම්කරණය හා කළමනාකරණය සඳහා මූලික ඒකකය ලෙස සැළකීමට අවධාරණය කෙරේ. වසර 2010 වන විට, මහවැලි ගංගා ද්‍රෝණි අධිකාරිය, බස්නාහිර ගංගා අධිකාරිය සහ දකුණු ගංගා ද්‍රෝණි අධිකාරිය ආදි ද්‍රෝණි අධිකාරි කිහිපයක්ම, ඒවායේ ගංගා ද්‍රෝණි ඒකාබද්ධ ලෙස සංවර්ධනය කිරීමේ අරමුණින් ක්‍රියාත්මක වනු ඇතැයි ද, අත්දැකීම් පදනම් කරගෙන, අනෙකුත් ගංගා ද්‍රෝණි සඳහා ද මෙම සංකල්පය ව්‍යාප්ත කරලීමට සුදුසු පියවර ගනු ඇතැයිද, 2010 යේ පෙර දැක්ම (ක්‍රම සම්පාදන අමාත්‍යාංශය) අපේක්ෂා කරයි.

මේවා නිසැක වශයෙන්ම ධනාත්මක සංවර්ධන කටයුතුය. එළැඹෙන වසරවල් තුළදී පැන නැගෙන නව ගංගා ද්‍රෝණි ආයතන සඳහාද, මෙම පවිත්‍ර ගංගා කාර්ය බලකාය මගින් එහි වගකීම් ඉටුකරන බව පිළිගනු ලැබේ.

මෙකී ධනාත්මක සංවර්ධන කටයුතු මගින්, නාගරික ජනයාට කුරුල්ලන්, මත්ස්‍යයන් නරඹමින් විනෝදයෙන් තම විවේකය ගත කළ හැකි වන පරිදි පැහැදිළි සුනිල් ජලයෙන් යුක්තවූද, ඉවුරු දෙපස ගස්කොළං වලින් ද සුමුදු වැල්ලෙන් ද ගහණ වූ ද කැළණි ගංගාවක් පිළිබඳ අපි සිහින දකිමු. දියවන්නා ඔය හා යාබද ජල ව්‍යුහද, අපේ පුරාණ කවීයෙන් විස්තර කෙරෙන පරිදි නැවතත් පස් පියුමින් සුසැදෙමින්, ශ්‍රී ජයවර්ධනපුරයට එමත්කාරයක් දෙනු ඇත. විදේශිකයන්ට පමණක් නොව කොළඹ නගරවාසීන්ටද ජල ක්‍රීඩා මධ්‍යස්ථානයක් බවට පත්වන බේරේ වැව ජාතික ජල ක්‍රීඩා පවත්වන ස්ථානය බවට පත්වෙන අතරම, සාම්ප්‍රදායික හා නූතන ජල ක්‍රීඩා තරඟ පවතවන ස්ථානය බවටද පත්වෙනු ඇත. අතීතයේදී මෙන්ම, මහනුවර ප්‍රදේශයේ දරුවෝද මැද ඇළේ ජලයේ ක්‍රීඩා කරනු ඇත. දූෂණය හා ලවනීකරණය හේතුකොට ගෙන ජලජ ජීවීන් අහිමි වූ කිඹුලාවල නැවතත් කිඹුලන්ගෙන් ගහණ වූ ආකර්ෂණීය ප්‍රදේශයක් බවට පත්වනු ඇත. එසේම, නිල්වලා ගඟද, පුරාණ ජනකවියෙකු විසින් පවසන ලද පරිදි, අහිංසක කිඹුල් පැටියන් වෙසෙන පෙදෙසක් බවට පත්වනු ඇත. මෙම සිහින සැබෑවනු ඇතැයි හෝ නාගරික අපද්‍රව්‍ය සහ වසංගත වලින් ගහණ වූ දුගඳ හමන ගංගා පද්ධතියක් පිළිබඳව අපි විශ්වාස කරමු.